**පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය - 2022**

**-----------------------------------------------------------------------------------------**

පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය අතර 2015 ඔක්තෝබර් 02 දින එළඹි අංක සීඑල්කේ 101104 එල් දරන ණය පහසුකම් ගිවිසුම සහ 2016 නොවැම්බර් 18 දින එළඹි අංක සීඑල්කේ 101104 එල් දරන සංශෝධිත ණය පහසුකම් ගිවිසුමේ 3.4.3(ඌ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුමට අනුව, එවකට විදුලිබල අමාත්‍යාංශය, වර්තමානයේ බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පුනර්ජනනීය බලශක්ති ජාලක අවශෝෂණ ධාරිතාව ඉහළ නැංවීම, සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ පෞද්ගලික අංශයේ දායකත්වය සඳහා අවස්ථාව ලබා දීම මගින් ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ කටයුතු මාලිබොඩ, වේවැල්වත්ත, නාවලපිටිය, රාගල යන ප්‍රදේශවල කිලෝවොට් 132/33 ජාල උපපොළවල් ඉදිකිරීම යන සංරචක හතරක් යටතේ ක්‍රියාත්මක වේ. ණය පහසුකම් ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 6,660.10 කට සමාන යුරෝ මිලියන 41.10 ක් වන අතර ඉන් රු.මිලියන 4,865.90 කට සමාන යුරෝ මිලියන 30 ක් ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ විය. ඉතිරි රු.මිලියන 1,794.20 කට සමාන යුරෝ මිලියන 11.1 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරිමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 ජනවාරි 06 දින ආරම්භ කරන ලද අතර 2019 ඔක්තෝබර් 31 දින වනවිට නිම කිරිමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2023 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 ඡේදයෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශයේ දක්වා ඇති ලද මුදල් සහ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශයේ දක්වා ඇති ලද මුදල් අතර රු. මිලියන 6.6ක වෙනසක් තිබුණි. කෙසේවෙතත්, එය සැසඳීමක් කර නොතිබුණි. | 6.6 | ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (AFD) මුළු දායකත්වය යුරෝ 23,119,580 ක් වූ අතර ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය හරහා ගෙවීම් වන සියලුම අන්තර් ගෙවීම් සහතික නිසි ලෙස ගිණුම්ගත කර ඇත.<br>යුරෝ 28,227 (ඇමරිකානු ඩොලර් 30,430.28 ට සමාන) සඳහා ගෙවන ලද මුදල සඳහා වන ගෙවීම් සහතිකය විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයේ සටහන් කර නොමැත. | වෙනස්කම් නිරවුල් කර ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනයේ (AFD) දායකත්වය නිවැරදිව සඳහන් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනයේ අරමුදල් හරහා මිලදී ගත් මෝටර් රථවල පිරිවැය රු.මිලියන 182.7 ක් වූ අතර එය 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ, පිරියත සහ උපකරණ යටතේ දක්වා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 දෙසැම්බර් 31 දිනට වාහනවල ශේෂය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 182.7 | මෙය දැනටමත් පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතියේ 2023 ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර ඇත. | එය මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූල විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළව විශේෂ විදේශ මුදල් බැංකු ගිණුම සඳහා වූ පොලී ආදායම රු.මිලියන 1 ක් සහ රු.මිලියන 0.4 ක් ලංකා විදුලිබල මණ්ඩල දායකත්ව ගිණුමේ සටහන් කිරීමකින් තොරව පිළිවෙලින් කොන්ත්‍රාත්කරුගේ ගිණුමට සහ ප්‍රාග්ධන වියදම් ගිණුමට බැර කර තිබුණි. | 1.4 | මෙය දනටමත් පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතියේ 2024 මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර ඇත. | විශේෂ විදේශ මුදල් බැංකු ගිණුමෙන් ලැබෙන පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුගෙන් ලංකා විදුලිබල මණ්ඩල වෙත මාරු කරන ලද රු.මිලියන 13.2 ක ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනයේ අරමුදල් හරහා මිලදී ගත් මෝටර් රථයක පිරිවැය, කෙරීගෙනයන වැඩවලට බැර කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත්කරුගේ ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 13.2 | මෙය දැනටමත් පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතියේ 2024 මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර ඇත. | මාරු කරන ලද වාහනයේ පිරිවැය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | 2022 දෙසැම්බර් 31 වන දිනට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර තිබුණද, රු.මිලියන 8.5ක ඉඩම් සහ ඉන්ධන තැන්පතු පියවීමකින් තොරව පැවතුනි. තවද, 2022 දෙසැම්බර් 31 වන දිනට ඉඩම් සහ ඉන්ධන තැන්පතු සම්බන්ධ තහවුරු කිරීම් විගණනය සඳහා ලබා ගත නොහැකි විය. | 8.5 | ඉඩම් සහ ඉන්ධන තැන්පතු 2024 වර්ෂයේදී නිරවුල් කරනු ලබන අතර පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන්හි 2024 වර්ෂයේ ශේෂයක් නොමැත. | ඉඩම් සහ ඉන්ධන තැන්පතු නිරවුල් කිරීම කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඊ) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ ශ්‍රී ලංකා රජය විසින් දරන ලද රු. මිලියන 138.6 ක් වූ ණය ගැනුම් පිරිවැය සහ රු.මිලියන 102.5 ක් වූ බැඳීම් ගාස්තුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 241.1 | මෙම ණය මුදල ශ්‍රී ලංකා රජය විසින් ලබාගෙන ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දෙනු ලැබේ. එබැවින්, ණය ගැනීමේ පිරිවැය හඳුනා ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය සඳහා යාන්ත්‍රණයක් නොමැති අතර, එබැවින් එය සලකා බලනු නොලැබේ. | මෙම කාරණය සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 පද්ධති හා පාලනයන්

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ------------------------------ | ------------------------------ | ------------------------- |
| ගිණුම්කරණය පිළිබඳ නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් තුළ,මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමෙන් පසු සාධාරණ කාලයක් තුළ (ආසන්න වශයෙන් මාස 02ක් ඇතුළත) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2024 අගෝස්තු 20 දින විගණනයට ඉදිරිපත් කරන ලදී. | කළමනාකරණ අදහස ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමෙන් පසු සාධාරණ කාලයක් තුළ (ආසන්න වශයෙන් මාස 02ක් ඇතුළත) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |